# මධ්‍යම කඳුකරය ආශ්‍රිත සාම්ප්‍රදායික හේන් වගා පිළිවෙත්හි කාලීන උපයෝගිතාව හා තිරසර පාරිසරික අඛණ්ඩතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (බදුල්ල දිස්ත්‍රික්කයේ වියළුව හා ලුණුගල කලාප පදනම් කරගත් විමර්ශනයකි)

**ආර්.එම්.එන්. සඳමාලි[1], ඩී.එම්.යූ. සමාධි[2]**

ප්‍රමුඛ පද: කඳුකර හේන් වගාව, පාරිසරික තිරසර බව, සංරක්ෂණය, සාම්ප්‍රදායික දැනුම

## හැඳින්වීම

සමකාලීන සමාජයන් දේශගුණික විපර්යාස, පාංශු භායනය, ජල හිඟය සහ ජෛව විවිධත්වය අහිමි වීම වැනි ප්‍රතිවිපාකවලට තීව්‍ර ව මුහුණ දෙන තත්ත්වයන් තුළ පාරිසරික තිරසරභාවය තීරණාත්මක ගෝලීය ප්‍රමුඛතාවයක් බවට පත්ව ඇත. මෙම සන්දර්භය තුළ ලංකාවේ සාම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත් සතු පාරිසරික තිරසරභාවය පිළිබඳ යාවත්කාලීන අවබෝධය වත්මන් කෘෂිකර්මාන්තයට ප්‍රයෝජනවත් විය හැකිද යන්න අධ්‍යයනය හරහා සිදු කරනු ලබයි. එවැනි පිළිවෙත් තුළ අන්තර්ගත පරිසර හිතකාමී ලක්ෂණ හඳුනා ගැනීම සහ නූතන තිරසරභාවය පිළිබඳ විග්‍රහයකින් නවීන කෘෂි තාක්ෂණයට ඒවා ඒකාබද්ධ කළ හැකි ආකාරය විමර්ශණය කිරීම අධ්‍යයන අරමුණු වශයෙන් පවති. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික කෘෂිකාර්මික භාවිතයන් ශතවර්ෂ ගණනාවක් පැරණි දේශීය දැනුම් පද්ධති තුළ මුල් බැස ඇති අතර ඒවා තිරසර ජීවන රටාව සහ පරිසර හිතකාමී ආහාර නිෂ්පාදනය පිළිබඳ වටිනා අවබෝධයක් ලබා දෙයි. ස්වභාවධර්මය සමඟ පරම්පරා ගණනාවක අන්තර්ක්‍රියා හරහා පරිණාමය වූ මෙම භාවිතයන්, නූතන පාරිසරික චලනයන්ට පෙර පැවති ගැඹුරු පාරිසරික විඥානයක් පෙන්නුම් කරයි. සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය කෘෂිකර්මාන්තය කාබනික යෙදවුම් භාවිතය, ස්වභාවික ක්‍රම මගින් පාංශු සංරක්ෂණය, වාරි පද්ධති හරහා ජල කළමනාකරණය, බෝග මාරුව, කෘමි පාලනය සහ සමෝධානික වගා ක්‍රම වැනි තාක්ෂණික ක්‍රම මගින් සංලක්ෂිතව පැවතිණි. ඵලදායිතාව පමණක් නොව දිගු කාලීන පාරිසරික සමතුලිතතාවය ද ඉලක්ක කර ගනිමින් පරිසරය සමඟ සුසංයෝගී සබඳතාවක් මෙම භාවිතයන් පිළිබිඹු කර ඇත. කෙසේ වෙතත් වේගවත් නවීකරණය, හරිත විප්ලවය සහ රසායනික මත යැපෙන ගොවිතැනේ නැගීම මෙම ක්‍රම වඩ වඩාත් ආන්තික කර ඇති අතර එය වර්තමාන කෘෂිකර්මාන්තයේ පැවැත්ම පිළිබඳ අර්බුදයක්ද මතු කරයි. සාම්ප්‍රදායික ක්‍රම වර්තමාන කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ භාවිතයන් වෙත අනුවර්තනය කිරීමේදී මතුවන ගැටළු සහ සංරක්ෂණය කිරීමේ අභියෝග ද අධ්‍යයනයෙන් ඉස්මතු කරයි.

[1, 2] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
ugcnimesha@gmail.com uththarasam@gmail.com

**ක්‍රමවේදය**

අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදු කර ඇත. කඳුකර හේන් ගොවිතැන් ක්‍රම තවමත් ක්‍රියාත්මක බදුල්ල දිස්ත්‍රික්කයේ වියළුව, ලුණුගල කලාප ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා යොදා ගැනුණු අතර එහිදි ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා සහභාගීත්ව නිරීක්ෂණ සහ පාරම්පරික කෘෂි පාරිසරික දැනුමක් ඇති වැඩිහිටි ගොවීන් සහ ප්‍රජා සාමාජිකයින් සමඟ අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා යොදා ගෙන ඇත. සාම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත්වල පරිණාමය සහ පාරිසරික වටිනාකම සොයා ගැනීම සඳහා ඓතිහාසික මූලාශ්‍ර, දේශීය ජනප්‍රවාද, පැරණි ගොවිතැන් ක්‍රම සහ පාරිසරික වාර්තා වැනි ද්විතීයික මූලාශ්‍ර ද පරීක්ෂා කරන ලදී. සොයාගැනීම් ප්‍රධාන කාණ්ඩවලට සංවිධානය කිරීම සඳහා තේමාත්මක හා සංසන්දනාත්මක විශ්ලේෂණ රාමුවක් භාවිත කර ඇත.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

බදුල්ල දිස්ත්‍රික්කයේ වියළුව හා ලුණුගල වැනි කලාපවල තවමත් යම් තරමකට ක්‍රියාත්මක සාම්ප්‍රදායික හේන් වගා ක්‍රමයන් කාලීන පරිසරයට අනුවර්තිත ගැළපීමකින් යුක්තව පවත්වාගෙන යන අතර ජෛව පද්ධති සංරක්ෂණය, ජල කළමනාකරණය හා පාරම්පරික දැනුම් සම්ප්‍රේෂණය වැනි පදනම් කෙරෙහි මෙම සාම්ප්‍රදායික කෘෂිකාර්මික ක්‍රමයන් දැඩිව සම්බන්ධ වී තිබේ. පර්යේෂණයේ ප්‍රාථමික දත්ත පෙන්වාදෙනුයේ භූමි හා ජලය සංරක්ෂණය සහ බෙදාහැරීම සඳහා භාවිත ක්‍රමවේද, ස්වභාවික අමුද්‍රව්‍ය පදනම් වූ පුනරාවර්තිත පාංශු සාරවත් කිරීම, පරිසරයට ගැලපෙන භෝග හා වගා ක්‍රම මෙන්ම අස්පර්ශීය උරුම භාවිත හරහා සමාජ ඒකාබද්ධතාවය තහවුරු කිරීම යන කරුණු තවමත් මෙම කලාප සතුව සුවිශේෂී ලෙස පවතින බවයි. කඳුකර ප්‍රදේශ වලදී හේන් වගාව සඳහා බහුලව භාවිත කර ඇත්තේ පතන් බිම් වන බැවින් ශාක ප්‍රජාවට වන බලපෑම් සීමා සහිත වී ඇති බව දක්නට ලැබේ. නිරන්තර වර්ෂාව සහිත තෙත් පස විශාල වෘක්ෂ කපා ගිනි තැබීමට බාධා කරන තත්ත්වයන් මෙන්ම ඒවයේ ඉක්මන් වර්ධනය මේ සඳහා හේතුව පවතී. වියළි කලාපයේ මෙන් නොව මෙහිදි මුල්කැට හෝ ඉරවලි ආකාරයේ සාමූහික වගාබිම් සීමා සහිත වේ. හේන් බොහෝ විට එකිනෙකට ඈතින් පිහිටුවා ගෙන තිබේ. සාමූහික ව ද බිම් සකස් කරගන්නා තැන් පවතී. හේන් තුළ පස සංරක්ෂණය සඳහා දීර්ඝකාලීන ක්‍රමවේද අනුගමනය කරනු ලැබ ඇත. ගල්වැටි හා කානු පද්ධති, හෙල්මළු සහ ශාක වැටි එහිදී ප්‍රධාන වේ. නිරීක්ෂණයන්ට අනුව අතහැර දමන ලද එවැනි හේන් බිම් සතු පාංශු සංරක්ෂණ ක්‍රම අද ද ප්‍රතිඵලදායක වී පවතී. කඳුකර හේන් සතු සුවිශේෂී ලක්ෂණයකි වාර්ෂිකව අස්වැද්ද වීම. ඒ සීමා සහිත භූමි අවකාශය මත ඇති වූ තත්ත්වයකි. මෙම කලාපයේ ඇතැම් හේන් අද වන විට බලපත්‍ර මත සංවර්ධන වූ බහුවාර්ෂික භෝග වගා බිම් ය. තේ, ගම්මිරිස්, වැනිලා මෙන්ම දැව වගාවන්ද ඒ තුළ පවත්වාගෙන යයි. එම තත්ත්වයන් ආර්ථික අතින් ප්‍රතිඵලදායක මෙන්ම පරිසර හිතකාමී තැනකට ද සාම්ප්‍රදායික වගාබිම් පරිවර්තනය කර ඇත.

තවදුරටත් එවැනි වගා අවස්ථා බොහෝමයක් පවතින මුත් යම් යම් නෛතික අවහිරතා මත එයට ඉඩක් නොමැති බව අදහස් දැක්වූවන් සඳහන් කර සිටි. වියළි කලාපයට සාපේක්ෂව මෙම ඌණ භාවිත පාරම්පරික වගාබිම් පුනර්සංවර්ධනය එම කලාපය වල පරිසරය සහ මානවයා අතර උද්ගත කාලීන ගැටලු සඳහා යම් විසඳුමක් ද යෝජනා කරයි.

**සමාලෝචනය**

සාම්ප්‍රදායික කඳුකර හේන් වගා බිම් කාලීන පරිසරය සමඟ සමතුලිතව සංවර්ධනය කළ හැකි පරිසර හිතකාමී ව්‍යාපෘතීන් වශයෙන් අධ්‍යයනය හඳුනා ගන්නා ලදී. ජෛව සංරක්ෂණය, ජල කළමනාකරණය, පාංශු සංරක්ෂණය සහ සමාජ ඒකාබද්ධතාවය වැනි පරිසර හා සමාජමය පරිණාමයන් සාම්ප්‍රදායික හේන් වගා ආශ්‍රිත ක්‍රියාත්මක පිළිවෙත් තුළ හඳුනාගත හැකි මූලික ලක්ෂණ වේ. නවීන කෘෂි තාක්ෂණය සමඟ ඒවා සමපාත වන තත්ත්වය තිරසර කෘෂිකර්මයකට යළි මෙම පද්ධති ඒකාබද්ධ කිරීමට ඇති හැකි පිළිඹිබු කරයි. අතහැර දමන්නට යෙදුන හේන් අද වන විට බාලොලි, ගිනි, මාන හෝ පතන්පාළු වැනි කිසිඳු ආර්ථික වටිනාකමක් නොමැති ශාක ගහනයන්ට යටත්ව පවති. මේවා තුළ පහසුවෙන්ම අන්නාසි, කෝමාරිකා, කටු අනෝදා මෙන්ම ගම්මිරිස්, තේ, කුරුඳු හා කෝපි වැනි භෝග යළි වගා කළ හැකි විභවය සාධනීය වේ. කාලයක් පුරා මෙම භූමි සංවර්ධනය කළ පරිසර හිතකාමී පිළිවෙත් භූමිය සංරක්ෂණය කර ඇති පදනම මත ය. මේ සඳහා රාජ්‍ය මැදිහත්වීම සහ නව නීති රාමුවක අවශ්‍යතා ව දැඩිව මතුව පවතින බව අධ්‍යයන නිගමනය වේ.

**ආශ්‍රිත මූලාශ්‍රය**

කුමාරතුංග, ජී.බී. (2007). ***පැරණි ලංකාවේ කෘෂිකර්මය.*** කොළඹ: සරසවි ප්‍රකාශකයෝ.

දොළපිටිය, ඩී.එම්. (2009). ***ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික ගොවිතැන හා පාරම්පරික දැනුම.*** කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

වරකාපොල, පී.බී. (2015). ***ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික ජල කළමනාකරණ ක්‍රම සහ පරිසරය***, ඉතිහාස හා සංස්කෘතික සඟරාව.